fairfirst
INSURANCE
A FAIRFAX Company

# ප්‍රවාහන ක්ෂේත්‍රයේ සේවයේ නියුතු පුද්ගලයන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමට උපදෙස්

v 1.0 - 21/05/2020

COVID-19 වසංගතය නිසා ලොව පුරා ජනතාවට තම ජීවන රටාවන් හා රැකියා ක්‍රමවේදයන් වෙනස් කිරීමට සිදුවී ඇත. මේ වනවිට ලොව බොහෝ රටවල් තම ආර්ථිකයන් නැවත පණගැන්වීම සඳහා උත්සාහ දරමින් සිටී. ඒ අතරම, රාජ්‍ය හා පෞද්ගලික ආයතන තම කටයුතු නැවත ආරම්භ කිරීමට පියවර ගෙන ඇත.

මෙම පසුබිම තුළ, ප්‍රවාහන කර්මාන්තයේ සේවයේ යෙදෙන සේවක සේවිකාවෝ තම ආරක්ෂාව තහවුරු කරගැනීම සම්බන්ධයෙන් සුවිශේෂී වූ අභියෝග රැසකට මුහුණ දී සිටිති. COVID-19 රෝගයෙන් ආරක්ෂා වීමේදී සමාජ දුරස්ථකරණය, පෞද්ගලික සනීපාරක්ෂාව සහ ශ්වසන මාර්ගය ආශ්‍රිත සනීපාරක්ෂාව අතිශයින් වැදගත් වන නමුත් මෙම ක්ෂේත්‍රයේ සේවක සේවිකාවන්ට එම මාර්ගෝපදේශ අකුරට පිළිපැදීම දුෂ්කරය. කෙසේ වුවද, මෙහි දක්වා ඇති උපදෙස්, ඔවුන්ට තම රැකියාව අතරතුර හැකි උපරිමයෙන් ආරක්ෂා වීම සඳහා අත්වැලක් වනු ඇත.

# අවදානම වටහා ගැනීම

- COVID-19 පැතිරෙන ආකාරය සහ එහි බරපතලභාවය පිළිබඳව පැහැදිලි අවබෝධයක් තිබිය යුතුය.
- ආසාදනයේ ස්වභාවය අනුව, ඔබට රෝගය වැළඳීමට අමතරව ඔබ රෝග වාහකයෙකු බවට පත්වීමටද ඉඩ ඇත.
- වෙනත් බෝවන රෝග වලට සාපේක්ෂව, COVID-19 රෝගය සුවවීම සඳහා දීර්ඝ කාලයක් ගතවේ.
- වෙනත් සෞඛ්‍ය ගැටලු සහිත පුද්ගලයන්ට COVID-19 මගින් වැඩි බලපෑමක් එල්ල විය හැකි අතර මෙම කාණ්ඩයේ මරණ අනුපාතය ඉහළය.
- ඇතැම් පුද්ගලයන් රෝග ලක්ෂණ නොපෙන්වන නිසා ඔවුන් නොදැනීම රෝග වාහකයන් බවට පත්වීමට ඉඩ තිබේ.

# බෙදාහැරීමේ සේවාවන්

- ජනාකීර්ණ ස්ථානයන් හා කාර්යබහුල වේලාවන් මගහැරීම සඳහා හැකි සෑම අවස්ථාවකදීම ගමනාගමන කටයුතු කල්තබා සැලසුම් කරන්න.
- භාණ්ඩ භාරගැනීමේ හා පැටවීමේ වේලාවන් විෂම ලෙස සැලසුම් කරන්න.
- භාණ්ඩ භාරගැනීම හා පැටවීම සහ ඊට අදාළ ස්ථාන සහ ක්‍රියාවලි විධිමත් ලෙස මුද්‍රණය කර ප්‍රදර්ශනය කරන්න.
- හැකි සෑම අවස්ථාවකදීම භාණ්ඩ පැටවීම හා බෑම සඳහා වරකට එක් සේවකයෙකු පමණක් යොදවන්න.
- ඇතුලුවන ස්ථාන වල ඇති මුරකුටි සහ ගබඩා වැනි ස්ථාන වලදී අනෙකුත් පුද්ගලයන් සමග ගනුදෙනු කිරීමට සිදුවන අවස්ථා අවම කරන්න. උදාහරණයක් ලෙස බෙදාහැරීමේ කටයුතු පෙර සැලසුම් කර, වෙනත් පුද්ගලයෙකු සමග ගනුදෙනු කිරීමට අවශ්‍ය නොවන ආකාරයට කටයුතු කරීම.
- ලිපිලේඛන වලදී හැකිතාක් මුද්‍රිත ලේඛන වෙනුවට ඉලෙක්ට්‍රොනික විකල්ප භාවිතා කරන්න.
- එක් රථයක් තුළ සේවයේ යෙදෙන පුද්ගලයන් හැකි සෑම විටම එකට සේවයේ යොදවන්න.
- රියදුරන්ගේ ආරක්ෂාවට සහ රාජකාරී කටයුතු වලට බාධාවක් නොවන ආකාරයට, හැකිතාක් රථය තුළම රැඳී සිටීමට ඔවුන් යොමුකරවන්න.
- රියදුරන්ට ප්‍රමාණවත් තරම් දෑත් පවිත්‍රකාරක, භාවිතා කර ඉවත දැමිය හැකි ටිෂූ කඩදාසි සහ පානීය ජලය වැනි දේවල් ලබාදෙන්න.
- භාණ්ඩ භාරගැනීමෙන් පසු සහ භාරදීමෙන් පසු සෑම විටම දෑත් පවිත්‍ර කරගත යුතුය. සුක්කානම, ගියර් ආර්ම් එක සහ නිතර ස්පර්ශ වන අනෙකුත් ස්ථානද විෂබීජහරණය කළ යුතු වේ.
- දුම් පානය කිරීමට හෝ බුලත් සැපීමට අවසර නොදෙන්න.
- බෙදාහැරීමේ කටයුතු අවසන් වූ විට වාහනය පිරිසිදු කර විෂබීජහරණය කළ යුතු වේ. විශේෂයෙන්ම දොර හැඬල වැනි, නිතර ස්පර්ශ වන ස්ථාන විෂබීජහරණය කරන්න.



# මගී ප්‍රවාහන සේවා - බස්රථ

- සෑම ගමන් වාරයකටම පෙර බස් රථයේ දොරවල් සහ ඇතුළත විෂබීජහරණය කළ යුතුය.
- රියදුරු, කොන්දොස්තර, සහායකයන් සහ මගීන් සියලු දෙනා මුඛ ආවරණ පැළඳ සිටිය යුතුය (මේ බව සඳහන් වන පෝස්ටර් ප්‍රදර්ශනය කර තැබිය යුතුය).
- එක් රථයක් සඳහා එකම රියදුරෙකු හා කොන්දොස්තරවරයෙකු ඇතුළු එකම කණ්ඩායමක් දිගටම යෙදවීම වඩාත් යෝග්‍යය.
- මුදල් හුවමාරු වීම අවම කිරීම සඳහා, ගමන් ගාස්තුවේ වටිනාකම නිවැරදිව කොන්දොස්තරවරයා අතට ලබාදෙන මෙන් මගීන්ට දන්වා සිටින්න (මේ බව සඳහන් වන පෝස්ටර් ප්‍රදර්ශනය කර තැබිය යුතුය).
- බස් රථයට ඇතුළු වීමේදී මගීන්ට දෑත් පවිත්‍ර කරගැනීම සඳහා දොරටු අසල දෑත් පවිත්‍රකාරක බෝතල් තැබීම සුදුසුය.
- බස් රථයේ මගීන් ගැවසෙන හා ස්පර්ශ කරන සියලුම ස්ථාන දිනපතා විෂබීජහරණය කළ යුතුය.
- මගීන් නංවා ගැනීමේදී එකම දොරක් භාවිතා කළ යුතුය.
- සෞඛ්‍යය සහ ආරක්ෂාව සම්බන්ධ වැදගත් පණිවිඩ, බස් රථයේ මහජන ඇමතුම් පද්ධතිය ඔස්සේ විකාශය කරවීමට පියවර ගත යුතුය.
- බස් රථයේ ජනෙල් විවෘත කර වාතය හොඳින් සංසරණය වීමට ඉඩදිය යුතුය. නැතිනම් වායු සමීකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම මගින් රථයට නැවුම් වාතය ඇතුළු වීමට සැලැස්විය යුතුය.
- සෑම ගමන් වාරයක් අවසානයේදීම, නිතර ස්පර්ශ වන ස්ථාන වලට ප්‍රමුඛත්වය දෙමින්, බස් රථය විෂබීජහරණය කළ යුතුය.
- රියදුරු, කොන්දොස්තර හෝ මගීන් රථය තුළ දුම්පානය කිරීම හෝ බුලත් සැපීම සිදු නොකළ යුතුය.

# ත්‍රිරෝද රථ/කුලී රථ

- රජයේ නියමයන් අනුව, එක් ගමන් වාරයකදී රථයට නංවාගත හැක්කේ මගීන් දෙදෙනෙකු පමණි.
- මගීන් රථයට ඇතුළු වන විට ඔවුන්ට දෑත් පවිත්‍රකාරක ලබාදෙන්න. නැතිනම් දෑත් පවිත්‍ර කරගන්නා ලෙස ඉල්ලා සිටින්න.
- රියදුරා සහ මගීන් මුඛ ආවරණ පැළඳ සිටිය යුතුය.
- රියදුරා හෝ මගීන් රථය තුළ බුලත් සැපීම හෝ දුම් පානය කිරීම සිදු නොකළ යුතුය.
- රථය තුළදී කතාබහ කිරීම හැකිතාක් අඩු කරන්න. යායුතු ස්ථාන සම්බන්ධයෙන් තොරතුරු හුවමාරු කරගැනීම සඳහා Google locations වැනි ක්‍රම භාවිතා කරන්න.
- මුහුණ, නාසය, මුඛය හෝ දෑස් ස්පර්ෂ නොකිරීමට සියලු දෙනාම වගබලාගත යුතුය.
- ත්‍රිරෝද රථ වල මගීන් සහ රියදුරා අතර විනිවිද පෙනෙන ඝන ප්ලාස්ටික් පුවරුවක් හෝ පොලිතීන් ආවරණයක් තිබිය යුතුය (මෙය රියදුරාගේ ආරක්ෂාවට අතිශයින් වැදගත්ය).
- රථයේ ගමන් කිරීමේදී මගීන් නිසි ආකාරයට අසුන් ගෙන සිටිය යුතුය. ඉදිරියට නැමී සිටීම වැනි ඉරියව් මගින් ඔවුන් සහ රියදුරා අතර පරතරය අඩුවී අවදානමක් මතුවීමට ඉඩ ඇත.
- මුදල් හුවමාරු වීම අවම කිරීම සඳහා, ගමන් ගාස්තුවට අදාළ මුදල පමණක් (මාරු කාසි/නෝට්ටු සමග) රියදුරා අතට ලබාදෙන මෙන් මගීන්ට දන්වා සිටින්න.



# COVID-19 ව්‍යාප්තියෙන්, ඔබ සහ වෙනත් අය රැක ගැනීම



අවම වශයෙන් තත්පර 20 ක් වත් සබන් යොදා අත් සෝදන්න නැතිනම් මද්‍යසාර පදනම් වූ අත් සනීපාරක්ෂක ද්‍රාවණයකින් ඔබේ දෑත් පිරිසිදු කරගන්න.



නිවසින් පිටවන විට මුහුණු වැස්මක් පළඳින්න.



ඔබේ ඇස්, නාසය සහ මුඛය ස්පර්ශ කිරීමෙන් වළකින්න.



සෙම්ප්‍රතිශ්‍යාව හෝ උණ වැනි රෝග ලක්ෂණ පෙන්නුම් කරන ඕනෑම අයෙකු සමඟ සමීප සම්බන්ධතා පැවැත්වීමෙන් වළකින්න.



ඔබ රෝගී තත්ත්වයකින් පෙළෙන්නේ නම්, නිවසේ රැඳී සිටිමින් සමූහයා සමග සම්බන්ධතා මග හරින්න.



කැස්ස හෝ කිවිසුම් යන විට ඔබේ නැමුණු වැලමිටෙන් ඔබේ මුඛය සහ නාසය ආවරණය කරන්න. නැතිනම් ටිෂු පත්‍රයක් භාවිතා කරන්න. භාවිතා කළ ටිෂු පත්‍රයක් භාවිතයෙන් පසු ආවරණය වූ කසල බඳුනකට විසි කරන්න.



අතට අත නොදෙන්න. අත වනා හෝ හිස නමා අනෙකාට ආචාර කරන්න.



ඔබට උණක්, කැස්සක් සහ හුස්ම ගැනීමේ අපහසුතාවයක් තිබේ නම්, ප්‍රමාද නොවී වෛද්‍ය ප්‍රතිකාර ලබාගන්න. ඔබ ගමන් ගෙන ඇති සියලු ස්ථාන පිළිබඳවද විස්තර ඔබේ සෞඛ්‍ය සේවා සපයන්නා සමඟ බෙදාගන්න.

**වැඩි විස්තර සඳහා අමතන්න:**
ලලීන්ද්‍ර වික්‍රමසිංහ
ජ්‍යෙෂ්ඨ කළමනාකරු - අවදානම් ඉංජිනේරු
ජංගම: 0777 238 034 | විද්‍යුත් තැපෑල: laleendraw@fairfirst.lk

වියාචනය: මෙම ලේඛනයේ දක්වා ඇති මාර්ගෝපදේශයන් ඔබ සහ ඔබගේ ආදරණීයයන් COVID-19 වෛරසයෙන් ආරක්ෂා කිරීමට ඉදිරිපත් කරන ලදී. ඔබට මෙම ලේඛනය පදනම් කර ගනිමින් යම් ක්‍රියාමාර්ගයක් ගැනීමට අවශ්‍ය නම් හෝ කිසියම් කොටසක් පැහැදිලි කරගැනීමට අවශ්‍ය නම් වෘත්තීය උපදෙස් ලබා ගන්න.

**COVID-19** වසංගත තත්ත්වය පවතින කාලය තුළ ආරක්ෂාකාරීව රාජකාරි කටයුතු සිදුකළ යුතු ආකාරය සම්බන්ධයෙන් එක්සත් රාජධානියේ රජය විසින් ප්‍රකාශයට පත්කරන ලද තොරතුරු පදනම් කරගනිමින් මෙම ලේඛනය පිළියෙල කරන ලදී.